(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 3(7).]**

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 පෙබරවාරි 20 සිකුරාදා**

---

**2026 මාර්තු 03 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 18 දිනැති අංක 2467/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2026 මාර්තු 05 බ්‍රහස්පතින්දා)**

1851/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1989.11.13 වන දින ඝාතනය කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර මහතාගේ මරණයෙන් පසු, ඔහුගේ බිරිඳ සහ දරුවන්ව ආරක්ෂා කිරීම සඳහා රජයේ රැකවරණය ලබාදීමට රජය විසින් කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එලෙස රජයේ රැකවරණය ලබා දුන් තැනැත්තන්, රෝහණ විජේවීර මහතා සමඟ තිබූ ඥාති සම්බන්ධතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තැනැත්තන් රඳවාගෙන සිටි ස්ථාන කවරේද;

(iv) වර්තමානයේ රජයේ රැකවරණය සහ නඩත්තු ලබන රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන් කවුරුන්ද;

(v) රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන්ගේ නඩත්තුව සඳහා මෙතෙක් රජය විසින් දරා ඇති ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(vi) වර්තමානයේ රජයේ රැකවරණය ලබන එම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව සහ නඩත්තුව සඳහා මසකට රජය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මාර්තු 17 අඟහරුවාදා)**

1849/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ණය සහනදායක ආඥාපනත සහ එහි කාර්ය පටිපාටිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ 2025.07.15 දිනැති වාර්තාව ලැබී තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටු වාර්තාවේ සඳහන් ප්‍රධාන නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ අනුව මේ වනවිට සිදු කර ඇති පරිපාලන වෙනස්කම් කවරේද;

(v) කමිටු වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීමට අපේක්ෂිත නීතිමය සංශෝධන කවරේද;

(vi) එම සංශෝධන සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ණය සහනදායක මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ණය සහනදායක මණ්ඩලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(iv) 2026 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලය වෙනුවෙන් රජය විසින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අප්‍රේල් 07 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

749/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට ඉන්ධන සහනාධාරය ලබන ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) ඉන්ධන සහනාධාරය නිසි වේලාවට ධීවරයන්ට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

764/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කඩවත-මීරිගම දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම කොටස භාරව සිටි කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iii) මේ දක්වා ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට එහි ඉදිකිරීම් කටයුතු නැවතී ඇති බව දන්නේද;

(v) එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

842/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන රාශියක් විසින් අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කරදියාන ප්‍රදේශයේ අපද්‍රව්‍ය බලශක්ති බලාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) එමඟින් ජනනය කිරීමට අපේක්ෂා කරන ලද විදුලි ඒකක ප්‍රමාණය කොපමණද;

(iii) එම බලාගාරය ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර තිබෙන මුදල කොපමණද;

(iv) එම බලාගාරය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

884/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේපත්තුව, වාලච්චේනෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1014/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා සහ උතුරු පළාත තුළ කාන්තාවන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වාර්තා වූ මුළු සයිබර් අපරාධ පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ නිල සයිබර් අපරාධ වාර්තා කිරීමේ ද්වාර (Portals) හෝ පොලිස් සයිබර් ඒකක හරහා ලැබුණු එවැනි පැමිණිලි සංඛ්‍යාව උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ග්‍රාමීය ප්‍රදේශවල, විශේෂයෙන්ම උතුරු පළාතේ කාන්තාවන් උදෙසා අපරාධ වාර්තා කිරීමේ යාන්ත්‍රණවලට සහ වින්දිත සහාය සේවාවලට ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1030/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ සැත්කම් සඳහා කොළඹ, රිජ්වේ ආර්යා ළමා රෝහලේ පොරොත්තු ලේඛනවල මේ වනවිට සිටින ළමයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම රෝහලේ සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වයස අවුරුදු 16 දක්වාවූ ළමයින්ට පමණක් ප්‍රතිකාර ලබා ගත හැකි මෙම රෝහලේ විවිධ සැත්කම් සඳහා පොරොත්තු ලේඛනවල සිටිය යුතු කාලය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1089/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය සඳහා අලුතින් ලබාගත් A330-200 wide body ගුවන්යානය ලබා ගත් සමාගමේ නම කවරේද;

(ii) එම සමාගම නිර්දේශ කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) ඉහත ගුවන්යානයේ නිෂ්පාදිත දිනය කවරේද;

(iv) එම ගුවන්යානය ලබා ගෙන ඇත්තේ කුලී පදනම මතද;

(v) නොඑසේ නම්, බදු වාරික ගෙවීමේ පදනම මතද;

(vi) එසේ නම්, මාසික බදු වාරිකය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර තොගයක් ගබඩා කර තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එම පොහොර ගබඩා කර ඇත්තේ කවර වර්ෂයක සිටද;

(iv) ඉහත පොහොර තොගය මේ වනතෙක් ගොවීන්ට බෙදා නොදීමට හේතු කවරේද;

(v) එම පොහොර තොගය ගොවීන් වෙත බෙදා දීමට සැලසුම් කර තිබේද;

(vi) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(vii) ඉහත පොහොර තොගය ගෙවීන්ට බෙදා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1369/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් සහ පෞද්ගලික පාසල්වලින් වාර්තාවූ අපයෝජන සහ හිංසන ක්‍රියා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අපයෝජන සහ හිංසන ක්‍රියා හේතුවෙන් පාසල් හැර යාම් සහ සිය දිවි නසා ගැනීම් වාර්තාවී තිබේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල් හැර යාම් සහ සිය දිවි නසා ගැනීම් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ අපයෝජන සහ හිංසන ක්‍රියා සිදු වීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1679/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'අස්වැසුම' වැඩසටහන සම්බන්ධයෙන් ලබාදී ඇති අභියාචනා සහ විරෝධතා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා අතරින් නිරාකරණය වෙමින් පවතින සහ නැවත ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම නිරාකරණ ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'අස්වැසුම' ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා විද්‍යාත්මක දත්ත පද්ධතියක් හඳුන්වාදීමට අපේක්ෂා කරන්නේද;

(ii) එමඟින් තහවුරු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන නව දත්ත කවරේද;

(iii) ව්‍යාජ තොරතුරු මත ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(iv) ඔවුන්ට ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට සහ ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, ආපසු අයකර ගත් මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජීවන වියදම අනුව 'අස්වැසුම' ප්‍රතිලාභ ගැලපීමට යෝජනාවී තිබේද;

(ii) ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන් ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(iii) ඒ සඳහා දේශීය හෝ විදේශීය අරමුදල් වෙන් කර තිබේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 අප්‍රේල් 08** බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1318/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍යවරුන් 2500කට අධික සංඛ්‍යාවක් දීර්ඝ කාලයක සිට රජයේ පත්වීම් ලබා ගැනීමට නොහැකිව සිටින බවත්;

(ii) 2023 වර්ෂයේදී ලබා දෙන ලද ආයුර්වේද වෛද්‍ය පත්වීම් 61ක් තුළ යුනානි වෛද්‍යවරුන් සඳහා පත්වීම් ලබා නොදීම හේතුවෙන් යුනානි වෛද්‍යවරුන්ට අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ)(i)හි සඳහන් ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා රජයේ පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1456/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව්, මුල්ලියවලෙ තැපැල් කාර්යාලය ආරම්භයේ සිට මේ දක්වා කුලී ගොඩනැගිල්ලක ක්‍රියාත්මක වන බවත්;

(ii) ඒ සඳහා වෙන් කර ඇති භූමිය මේ වනවිට ශ්‍රී ලංකා යුද හමුදාව යටතේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ මේ වනවිට පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කර ඇති තැපැල් කාර්යාල සංඛ්‍යාව සහ ඒවා සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුල්ලියවලෙ තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ඒ සඳහා 2026 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1563/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පාඨමාලා වෙනුවෙන්, 2023 වර්ෂය සඳහා බඳවාගත් සිසුන්ගේ පාඨමාලා මේ දක්වා ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iv) එම පාඨමාලා ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1651/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2017 සිට 2019 දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් එහි අරමුදල් ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා භාවිත කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ සිදු කරන ලද මධ්‍යම සංස්කෘතික අරමුදලේ අංශය කවරේද;

(iii) ඒ සඳහා වැයකර ඇති මුදල කොපමණද;

(iv) ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2017 වර්ෂයේදී පිහිටුවන ලද ආගමික හා කලා කටයුතු සංවර්ධන අංශය භාරව සිටි නිලධාරීන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) ඉහත අංශයේ අධ්‍යක්ෂකවරයා පත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 'සිසු දහම් සෙවණ' දීප ව්‍යාප්ත වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එමඟින් එක් දහම් පාසල් ගොඩනැගිල්ලක් සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත වැඩසටහන යටතේ ඉදිකර ඇති දහම් පාසල්/ආගමික ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1655/2025

ගරු චානක මාදුගොඩ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (Inclusive Connectivity and Development Project) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම එක් එක් මාර්ගයේ නම සහ වැය කරන ලද මුදල දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩ ආරම්භ කර, එහෙත් වැඩ අවසන් කර නොමැති මාර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඉහත ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගාල්ල දිස්ත්‍රික්කයට අදාළව එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට දීර්ඝ කාලයක් ගතවීමට හේතු කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අප්‍රේල් 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1187/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පෙර පාසල් පවත්වාගෙන යනු ලබන අතර, එම පෙර පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල නිරත ගුරුවරුන්ට වැටුප් ගෙවීම් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පෙර පාසල්වල සේවය කරන, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වැටුප් ගෙවනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව සහ ඔවුන්ට ගෙවනු ලබන මුළු මාසික වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පෙර පාසල්වල සිසුන්ගේ නිල ඇඳුම් සඳහා දෙමාපියන්ගෙන් මුදල් අය කරගනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, එක් දරුවෙකුගෙන් අයකරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම මුදල අය කිරීමට හේතු කවරේද;

(iv) එම නිල ඇඳුම්වල හමුදා ලාංඡනය යෙදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම පෙර පාසල් පළාත් සභාව යටතේ පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවීම සඳහා වන නෛතික පදනම කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1408/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අයත් වවුනියාව, මන්නාරම හා මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්කයන්හි තමන්ටම හිමි ඉඩම්වල ජීවත් වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් අතරින්, රජයෙන් නීත්‍යානුකූල ඉඩම් බලපත්‍ර ලබා ඇති සහ ඉඩම් බලපත්‍ර ලබා නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයන්හි පදිංචි ජනතාවගේ ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සම්පාදනය කර තිබේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(v) පසුගිය රජය සමයේදී ක්‍රියාත්මක කරන ලද ‘උරුමය’ වැඩසටහන යළි ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1473/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ තලෙයිමන්නාරම ප්‍රධාන මාර්ගයේ බටහිර තාරාපුරම් ග්‍රාම සේවා කොට්ඨාසයේ, නිම නොකර අතහැර දමන ලද සමූපකාර ගම්මාන ව්‍යාපෘති ගොඩනැගිලි දෙකක් ඇති බව දන්නේද;

(ii) එම ඉදිකිරීම් සඳහා, මන්නාරම ප්‍රාදේශීය සභාවේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) ඒවා ඉදිකළ අරමුණ කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඇතුළු සියලු බලපත්‍ර ලබා ගෙන තිබේද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසියම් විමර්ශනයක් පවත්වා තිබේද;

(vi) එසේ නම්, එහි වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රකාශන ඔප්පුවක් මඟින්, ශ්‍රී ලංකා සීමාසහිත ව්‍යවසායක සංවර්ධන සමුපකාර සංගමය විසින් නීති විරෝධීව හිමිකාරිත්වය ලබා ගත් ඉඩමක මෙම ගොඩනැගිලි ඉදිකර ඇති බව දන්නේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහාම පිහිටුවා, එම අමාත්‍යාංශයේම ලියාපදිංචි කර ඇති, අක්‍රිය තත්ත්වයේ පවතින මෙම සංගමයේ ලියාපදිංචි ලිපිනය, ලියාපදිංචි කළ දිනය සහ ලියාපදිංචි අංකය කවරේද;

(iii) එහි ව්‍යවස්ථාවේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(iv) එහි සභාපතිතුමිය සහ අනෙකුත් සාමාජිකයින්ගේ නම්, පෞද්ගලික ලිපිනයන් ඇතුළු ඔවුන්ගේ විස්තර කවරේද;

(v) එමඟින් මෙතෙක් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1503/2025

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරන ලද භූමි ප්‍රමාණය සහ ගම්මිරිස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ ගම්මිරිස් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගම්මිරිස් වගාකරුවන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1545/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ප්‍රජාව ජීවත් වන ඉඩම් සඳහා නිරවුල් හිමිකම් ඔප්පු නොලැබීම හේතුවෙන් විවිධ අවස්ථාවලදී ඔවුන් අපහසුතාවයන්ට පත්වන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1640/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උත්ශ්‍රේණිගත කර නොමැති බවත්, ඒ හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතා පිළිබඳවත් දන්නේද;

(iii) එම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත නොකිරීමට හේතු කවරේද;

(iv) එම උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උත්ශ්‍රේණිගත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද ?

1673/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සින්න උල්ල, අරුගම්බේ, සර්වෝදයපුර, ජලාල්දීන් චතුරශ්‍රය, කුඩා කල්ලිය, විස්කි පොයින්ට්, කොට්ටුක්කල් සහ ලයිට් හවුස් වැනි සංචාරක ප්‍රදේශවල නිවාඩු නිකේතන පවත්වාගෙන යන පුද්ගලයන් සතු ඉඩම් සඳහා රජය විසින් මැනුම් සිදුකර ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(ii) එම ලිපිලේඛන නොමැති නිවාඩු නිකේතන, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමට නොහැකි බව පිළිගන්නේද;

(iii) ඒ හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය සභාවට අදාළ ව්‍යාපාර බදු අය කිරීමට නොහැකිවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ පෞද්ගලික මැනුම්කරුවන් මඟින් ඉඩම් මැනුම් සිදුකර ‘උරුමය’ ඔප්පු කඩිනමින් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නේද;

(v) එසේ සකස් කරන මිනින්දෝරු සැලසුම් භාවිතා කර එම ඉඩම් ‘උරුමය’ යෝජනා ක්‍රමයට ඇතුළත් කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1853/2026

ගරු රොෂාන් අක්මීමන මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය වරාය පසුගිය වර්ෂ 15ක කාලය තුළ ලබා ඇති මෙහෙයුම් ලාභය හෝ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වරායට අයත්ව තිබූ ජැටි හෝ පර්යන්ත, පසුව විවිධ පෞද්ගලික සමාගම් වෙත බදු පදනම මත හෝ වෙනත් පදනමක් යටතේ ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iv) එම සමාගම් විසින් වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හෝ වෙනත් ගෙවීම් නිසි පරිදි සිදු කර තිබේද;

(v) එසේ නම්, පසුගිය වර්ෂ 20ක කාලය තුළ එම ගෙවීම් සම්බන්ධ විස්තර කවරේද;

(vi) මේ වනවිට ත්‍රිකුණාමල වරාය තුළ රජයට පූර්ණ, අර්ධ හෝ යම් ප්‍රමාණයක හිමිකාරිත්වයක් පවතින ජැටි හෝ පර්යන්ත තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

(viii) ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1861/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස බඳවාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බඳවාගැනීමට අදාළ මූලික සුදුසුකම් කවරේද;

(iii) පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යභාරය කවරේද;

(iv) මේ දක්වා එම තනතුරේ සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1905/2026

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හඟුරන්කෙත තානායම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් බවත්;

(ii) එහි නීති විරෝධී ක්‍රියා සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ එම තානායම පවත්වාගෙන යනු ලබන පුද්ගලයාගේ නම කවරේද;

(ii) ඔහුට එම තානායම භාරදී ඇති පදනම කවරේද;

(iii) ඔහු එම තානායම පවත්වාගෙන යනු ලබන කාලය කවරේද;

(iv) රජයේ තානායම්වලින් ඵලදායි සේවාවක් ලබා ගැනීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2026 අප්‍රේල් 10 සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

25/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජයේ විශ්වවිද්‍යාලවල ඇති අනධ්‍යාන තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) 2019 වර්ෂයේ සිට මේ දක්වා එම විශ්වවිද්‍යාලවල අනධ්‍යාන තනතුරු සඳහා බඳවාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, තනතුරු හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විශ්වවිද්‍යාලවල අනධ්‍යාන තනතුරුවල ඇති පුරප්පාඩු පිරවීම ඉහළ විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

122/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ දක්වා හිමිවී තිබූ නිල වරප්‍රසාද කවරේද;

(ii) එම වරප්‍රසාද කප්පාදු කරන්නේද; නොඑසේ නම්, ඉවත් කරන්නේද;

(iii) එසේ නම්, කප්පාදු කරනු ලබන/ඉවත් කරනු ලබන වරප්‍රසාද කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදී ඇති වරප්‍රසාද සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ කවරේද;

(ii) ඊට අදාළ වාර්තා සභාගත කරන්නේද;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිල වාහනයක් ලබා දීම සහ ඔවුන්ට පාර්ලිමේන්තු භෝජනාගාරයෙන් ආහාර පාන ලබා දීම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

357/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මයිලවට්ටුවාන් ප්‍රදේශයේ ඇති කිරාන්පුල් වැව් බැම්ම, ස්ථිර බැම්මක් ලෙස ඉදිකිරීමට 2016 වර්ෂයේදී එවකට කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් මුල්ගල් තබා ඇති නමුත් මේ දක්වා ඊට අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

(ii) එම ස්ථිර බැම්ම ඉදිකිරීමෙන් හෙක්ටයාර් 8000කට අධික කුඹුරු ඉඩම්වලට ප්‍රතිලාභ ලැබෙන අතර ඉලුක්කුප්පොතාන, ඊරළකුලම, පාලමීන්මඩු සහ මයිලවට්ටුවාන් වැනි ගම්මානවලට ගොඩබිම හරහා ප්‍රවාහන පහසුකම් සපයා දිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම බැම්ම ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

567/2025

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙළෙඳපොළ සහල් හිඟයට පිළියමක් ලෙස මෑතකදී සහල් ආනයනය කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(ii) ඒ අනුව සහල් ආනයනය කරන ලද රජයේ සහ පෞද්ගලික ආයතනවල නම්, එම එක් එක් ආයතනය විසින් ආනයනය කරන ලද සහල් ප්‍රමාණය සහ එමඟින් රජයට ලැබුණු බදු ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වී මිලදී ගැනීම, වී ගබඩා කිරීම සහ සහල් අලෙවි කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දායකත්වය වැඩිකිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

641/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අයත්, පැයකට සහල් කිලෝ ග්‍රෑම් 2000 බැගින් සැපයීමේ ධාරිතාවයෙන් යුතු සහල් සැපයීමේ සංකීර්ණ 2ක් හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව ප්‍රදේශවල පිහිටා ඇති බව දන්නෙහිද;

(ii) එම සංකීර්ණ අවසන් වරට භාවිතයට ගනු ලැබූ වර්ෂය කවරේද;

(iii) මෙම සංකීර්ණ ඌන උපයෝජිතව පැවැතීමට හේතු කවරේද;

(iv) මේ සම්බන්ධව නිකුත් කර ඇති විගණන වාර්තාවේ දැක්වෙන කරුණු කවරේද;

(v) මෙම සංකීර්ණ නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1881/2026

ගරු ජගත් විතාන මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර බන්ධනාගාරයේ අනුමත රැඳවියන් සංඛ්‍යාව 811ක් වුවද, දැනට එහි 2000කට ආසන්න පිරිසක් රඳවා තැබීමෙන් ඇතිවී ඇති තදබදය පාලනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම බන්ධනාගාරයේ බන්ධනාගාර නියාමක සහ සැරයන් තනතුරු සඳහා පවතින විශාල පුරප්පාඩු සංඛ්‍යාව කඩිනමින් පිරවීමට පියවර ගන්නා දිනය කවරේද;

(iii) නිලධාරි හිඟය හේතුවෙන් දැනට සේවයේ නියුතු නිලධාරින්ට දින කිහිපයක් අඛණ්ඩව සේවය කිරීමට සිදුවන තත්ත්වය සමනය කිරීමට ඇති කෙටි කාලීන පියවර කවරේද;

(iv) පසුගිය වසරේ සිදු කළ ස්ථාන මාරුවීම්වලදී හිස්වූ තනතුරු සඳහා නව නිලධාරින් අනුයුක්ත නොකිරීමට හේතු කවරේද;

(v) ගාල්ල සහ මාතර බන්ධනාගාරවල සේවක අතිරික්තයක් සිටියදී කළුතර බන්ධානාගාරයේ සේවක හිඟයක් පැවතීමට හේතුවී ඇති අවිධිමත් සේවක මාරුවීම් නිවැරදි කරන්නේ කෙසේද;

(vi) නිලධාරින්ගේ හිඟය හේතුවෙන් රැඳවියන් අධිකරණයට ඉදිරිපත් කිරීම ප්‍රමාදවීමෙන් අධිකරණ කටයුතුවලට ඇතිවන බාධා වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1882/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාවට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සහ පාඨමාලා කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාඨමාලා සඳහා අදාළ ඇගයීම් ක්‍රමය පාඨමාලාවෙන් පාඨමාලාවට වෙනස් වන්නේද;

(iv) එසේ නම්, එම පාඨමාලා කවරේද;

(v) සිසුන් බඳවා ගැනීමෙන් පසුව නිශ්චිත කාල සීමාව තුළ අවසන් නොකළ පාඨමාලා තිබේද;

(vi) එසේ නම්, එම පාඨාමාලා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1884/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර වෙරළ තීරයට විශාල වශයෙන් එකතු වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා දීර්ඝ කාලීන සහ තිරසර ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් අර්බුදකාරී තත්ත්වයක් මතුව ඇති බවත්;

(ii) එම වෙරළ තීරයේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා භාවිතා කරනු ලබන ස්ථානවල ධාරිතාව සම්පූර්ණවී ඇති හෝ ඉක්මවා ඇති බැවින්, පළාත් පාලන ආයතනවලට අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ඉඩම් සොයා ගැනීමට නොහැකිවීමෙන් පරිසර දූෂණය හා සෞඛ්‍ය ගැටලු වර්ධනය වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර වෙරළ තීරයේ දැනට පවතින ඝන අපද්‍රව්‍ය හා සම්බන්ධ ගැටලුව කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන කඩිනම් පියවර කවරේද;

(ii) විදුලිබල නිෂ්පාදනය, ජෛව වායු නිෂ්පාදනය, ප්‍රතිචක්‍රීකරණය, ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ඇතුළුව සංයුක්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් මෙම කලාපය තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් සැලැස්මක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1904/2026

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පඩවුගම ග්‍රාම නිලධාරි වසමේ ඉන්දියානු ආධාර යටතේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘති තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිවල නම් කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතියේ නිවාස සංඛ්‍යාව, ආරම්භ කළ වර්ෂය, වියදම් කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම නිවාස ව්‍යාපෘති වෙනත් ස්ථානයකට ගෙනයාමේ සැලසුමක් තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1918/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටකෝට්ටේ පිහිටි 'ජන රජ සිටි' සුපිරි වෙළඳසැල් ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම සඳහා කලකට පෙර ඉවත් කර ඇති අතර, මේ වනතෙක් එය නැවත ඉදිකර නොමැති බවත්;

(ii) එහි වෙළඳාම් කළ වෙළෙන්දන් සඳහා කඩ කාමර ලබාදී තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි වෙළඳාම් කළ වෙළෙඳුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්බන්ධ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එය ඉදිකර අවසන් කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?